Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

**2016 Public Examination**

# Sinhala

## Continuers Level

**Wednesday 19 October: 2 pm Australian Eastern Daylight Time**

Reading Time: 10 minutes
Working Time: 2 hours and 30 minutes

- *You have 10 minutes to read all the papers and to familiarise yourself with the requirements of the questions. You must not write during this time.*
- *Monolingual and/or bilingual printed dictionaries may be consulted during the reading time and also during the examination.*

## Section 1: Listening and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 1.
2. Write all your answers to the questions in Section 1 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*© Victorian Curriculum and Assessment Authority 2016*

**Part A** (Questions 1–3)
(15 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings of each text. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in ENGLISH.

**Marks** | You may make notes in this space.

**Text 1**

1. (a) What is the new service and why did it begin on 29 September? **2**

_______________________________________________

_______________________________________________

_______________________________________________

_______________________________________________

(b) Identify **two** reasons why the service will be very popular. **2**

_______________________________________________

_______________________________________________

_______________________________________________

_______________________________________________

_______________________________________________

Marks | You may make notes in this space.

**Text 2**

2. (a) Identify the final conclusion that was reached about the ancient people who lived 5000 years ago and provide **two** pieces of evidence that supported this conclusion. **3**

- Conclusion ______________________________

______________________________

______________________________

- Evidence ______________________________

______________________________

______________________________

______________________________

______________________________

______________________________

(b) Why does the speaker say that history will need to be rewritten? **2**

______________________________

______________________________

______________________________

______________________________



PLEASE TURN OVER

Marks | You may make notes in this space.

**Text 3**

3. (a) Why is the person being interviewed an appropriate person to discuss this topic? **1**

(b) According to the discussion, what are **two** negative outcomes faced by the public? **2**

(c) Identify **three** different solutions to the problem that have been suggested. **3**

**Part B** (Questions 4–6)
(15 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings of each text. You may make notes at any time.

Listen carefully to each text and then answer the questions in SINHALA.

**Marks** | You may make notes in this space.

**Text 4**

4. (a) Explain briefly the situation that the captain may have to make a decision about before landing the aircraft. **2**

ගුවන්යානය ගොඩ බැස්සවීම පිළිබඳව, ගුවන් නියමුවාට තීරණයක් ගැනීමට හේතුවන තත්ත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

(b) Identify how the captain's decision might inconvenience the passengers. **1**

ගුවන් නියමුවා ගන්නා තීරණයෙන් මගීන්ට ඇතිවිය හැකි අපහසුතාවය හඳුනාගන්න.

(c) What instruction did the captain give to the passengers? **1**

ගුවන් නියමුවා විසින් මගීන්ට දුන් අවවාදය කුමක්ද?

Marks | You may make notes in this space.

**Text 5**

5. (a) Explain why Daya was surprised by Neetha's reason for being in a hurry. **2**

නීතාගේ කලබලයට හේතුව පිළිබඳව දයා පුදුම වූයේ මන්දැයි විස්තර කරන්න.

(b) Why does Daya feel sorry for the younger generation? **3**

බාල පරපුර පිළිබඳව දයා කණගාටු වන්නේ කුමක් නිසා ද?

Marks | You may make notes in this space.

**Text 6**

6. (a) Identify **two** values represented by the Nelum Tower and explain how these values are reflected in the architecture of the building. **4**

නෙළුම් කුළුණෙන් සංකේතවත් කරන වටිනාකම් **දෙකක්** හඳුනා ගෙන, එම වටිනාකම් මෙම ගොඩනැගිල්ලෙන් පිළිබිඹුවන අන්දම විස්තර කරන්න.

(b) What are the special features of the Nelum Tower's fourth and fifth floors? **2**

නෙළුම් කුළුණේ හතරවන සහ පස්වන මහල්වල ඇති විශේෂ ලක්ෂණ මොනවා ද?

**End of Section 1**

BLANK PAGE

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

## 2016 PUBLIC EXAMINATION

# Sinhala
## Continuers Level

### Section 2: Reading and Responding (25 marks)

**Instructions to Students**

1. Allow approximately 1 hour and 10 minutes for Section 2.
2. Write all your answers to the questions in Section 2 in this booklet in black or blue pen.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2016

**Part A** (Questions 7–8)
(10 marks)

---

*Your response will be assessed on how well you:*

- *understand general and specific aspects of texts (for example, by comparing, contrasting, summarising and/or evaluating) and convey the information appropriately.*

---

7. Read the text and then answer in ENGLISH the questions that follow.

**කැළණි ගඟ රැක ගනිමු**

සමීර ජයලත්

කැළණි ගඟ සමනළ කන්දෙන් ගමන් අරඹා වනපෙත් සහ ගම් නියම්ගම් හරහා කෙත්වතු සරු කරමින්, දීර්ඝ මගක් ගෙවා, මෝදර දී මහ සයුරට එකතු වේ. කොළඹ අවට ප්‍රදේශයේ පමණක් පවුල් ලක්ෂ පහක් පමණ කැළණි නදියෙන් දිවි රැක ගනිති. තවද පරිසරයට සුන්දරත්වයක් එකතු කරමින් ගලා යන කැළණි නදියට ඇත්තේ විශාල වටිනාකමකි. නමුත් දැන් එය දූෂණයට ලක්වෙමින් පවතී.

බොහෝ කර්මාන්ත ශාලා මඟින් රසායනික අපද්‍රව්‍ය සහ සායම් වර්ග කැළණි ගඟට මුදා හැරේ. හෝටල් වලින් ද අපිරිසිදු ජලය ගඟට එක් කෙරේ. සමහර නිවෙස්වල කුණු කසළ පවා හොර රහසේ ගඟට බැහැර කෙරේ.

කැළණි ගං ඉවුරේ ජීවත් වන පැල්පත් වාසීහු මේ ජලය පානයට ගැනීමෙන් රෝගී තත්ත්වයට පත්වෙති. තවද, විෂ ජලය මුහුදට එක්වීමෙන් මත්ස්‍යයන් පවා විනාශ වී ඇත.

ජලය මෙසේ දූෂණයට ලක්වන අතර, ගොඩනැගිලි තැනීමට ගඟෙන් වැලි ගොඩ දමමින් ගඟ විනාශ කෙරේ. තවද මැණික් සෙවීමට හෑරීමේ ප්‍රතිඵලයක් ලෙස ගං පතුලේ වලවල් සෑදී එයින් ජීවිත පවා විනාශ වී ඇත.

මේ දූෂණය වහා නවතා, කැළණි නදිය සංරක්ෂණය කිරීම ඇරඹිය යුතුය. ඒ සඳහා රජයේ මැදිහත්වීම අත්‍යාවශ්‍ය වේ. විෂ සහිත අපිරිසිදු ජලය කැළණි ගඟට මුදා හරින කර්මාන්ත ශාලා සහ හෝටල්වල බලපත්‍ර අහෝසි කළ යුතුය. කුණු කසළ ගෙනැවිත් බැහැර කරන නිවැසියන්ට දැඩි නියම කළ යුතුය. කැළණි ගඟ ආශ්‍රිතව වෙසෙන පැල්පත් වාසීන් දැනුවත් කර ඔවුන්ට අවශ්‍ය පහසුකම් සලස්වා දිය යුතුය.

ස්වභාව ධර්මයෙන් අපට දායාද කළ ඒ වටිනා ජාතික වස්තුව ආරක්ෂා කරගනිමු.

QUESTIONS

**Marks**

(a) Identify **two** different ways in which the environment of the Kelani River has been damaged and explain the impact of the damage on the people. **4**

(b) Provide evidence that suggests that the Kelani River is a national treasure. **1**

8. Read the text and then answer in ENGLISH the questions that follow.

**ඉන්දු - ලංකා පාලම**

රන්මලී බොතේජු

දකුණු ඉන්දියාවේ ධනුෂ්කොඩි සහ ශ්‍රී ලංකාවේ තලෙයිමන්නාරම අතර දූපත් පෙළ යා කරමින් කි. මී. 32 දිග පාලමක් ඉදිකිරීම පිළිබඳ යෝජනාව වසර ගණනක් තිස්සේ ඉදිරිපත් වෙමින් පැවතිණ.

පාලම ඉදිවීම ඉන්දිය සහ ශ්‍රී ලංකා සංස්කෘතික සහ ආර්ථික බැමි වඩා ශක්තිමත් කිරීමටත්, ප්‍රවාහන කටයුතු පහසු කිරීමටත්, හේතු වේ. දඹදිව වන්දනාවේ යන බෞද්ධ බැතිමතුන්ට ගුවන් ගමන සඳහා වැය වන අධික මුදල ගොඩ බිම් මාර්ගය විවෘත වීමෙන් අඩුවේ.

ඉන්දියානු ග්‍රන්ථයක් වන 'රාමායනයේ' සඳහන් වන අන්දමට රාම කුමරු ලංකාවට පැමිණ ඇත්තේ ද මේ දූපත් ආශ්‍රිත මාර්ගයක් ඔස්සේය. ඉන්දියානු වතු කම්කරුවන් විසින් රාම කුමරු වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ඉදි කරන ලද කෝවිල් වන්දනා කිරීමට දකුණු ඉන්දියාවේ බැතිමත්තු පැමිණෙති.

ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයෝ රෙදි පිළි, ආභරණ ආදිය ගෙන ඒමට නිරන්තරයෙන් ඉන්දියාවට යති. මේ හැම දෙනාම පාලම ඉදිවීම පිළිබඳව සුභවාදීව සිතති.

එහෙත් පාලමක් ඉදි වීමෙන් ශ්‍රී ලංකාවට අහිතකර බලපෑම් ඇති විය හැකි යැයි උගත්තු පවසති. කුඩා දූපතක් වූ ශ්‍රී ලංකාවේ අනන්‍යතාවයට සහ ස්වාධීනත්වයට මෙම පාලම හානිකර විය හැකි බව ඔවුන්ගේ මතයයි.

තවද පාලම සෑදීමේ දී සිදුවන හෑරීම් වලින් ශ්‍රී ලංකාවේ වයඹ දිග වෙරළ ඛාදනයට ලක් විය හැකි බව, පරිසරවේදීහු ප්‍රකාශ කරති. ධීවර කර්මාන්තයෙන් ජීවත් වන ජනතාවට ජීවනෝපාය මාර්ගය ද නැතිවී යා හැකිය. එපමණක් නොව මෙම ප්‍රදේශය ඛනිජ තෙල් සහ වායු නිධි වලින් බහුල බව සනාථ වී ඇත. සුභවාදී අනාගතයකට ධානාත්මකව බලා සිටින බාල පරම්පරාවට පාලම ඉදිවීමෙන් පසු මේ සම්පත අහිමි විය හැකිය.

පාලම ඉදි කිරීම පිළිබඳව රජය තීරණයක් ගැනීමේ දී, ඉන් ඇති විය හැකි වාසි සහ අවාසි දායක බලපෑම් පිළිබඳව ඉතා සැලකිලිමත්ව සසඳා බැලීම මැනවි.

QUESTIONS

**Marks**

(a) Explain the relevance of Prince Rama to the construction mentioned in this text. **1**

(b) Explain the final sentence of the text, and provide the possible positive and negative outcomes if the construction goes ahead as planned. **4**

**Part B** (Question 9)
(15 marks)

---

*Your response will be assessed on how well you:*
- *demonstrate an understanding of the stimulus text*
- *write text appropriate and relevant to context, purpose and audience*
- *structure and sequence information and ideas*
- *manipulate language structures and vocabulary in Sinhala.*

---

9. Read the text and then answer the question in approximately 150 words in SINHALA on page 7.

**අශෝක විදුහලට දීර්ඝායුෂ වේවා!**
**ගාමිණී ගුණසිරි**

අශෝක විදුහල දකුණු පලාතේ ඉතා ප්‍රසිද්ධ පාසලකි. අවුරුදු අසූවක පමණ කාලයක් පුරා මෙම පාසලෙන් ඉගෙනුම ලැබූ සිසු සිසුවියන් රටේ උසස් තනතුරු දරමින් රටට අති විශාල සේවාවක් සිදුකර ඇත. තවද ඔවුන්ගේ විශිෂ්ඨ දක්‍ෂතාවයන් රටට කීර්තියක් ද ලබා දී ඇත.

පසුගිය වසර කිහිපය තුල මෙම පාසලේ ප්‍රගතිය පිළිබඳව විමසිල්ලට ලක්වී තිබේ. මෙයට හේතුව නවීන තාක්‍ෂණ පහසුකම් වල අඩුපාඩුකම් බව බොහෝ දෙනාගේ මතයයි. තවද, විද්‍යාගාරවල උපකරණ පවා දැන් යල් පැන ඇත. පුස්ථකාලවල නව විෂයන් සඳහා අවශ්‍ය පොත් හිඟය. ක්‍රීඩා ක්‍ෂේත්‍රයේ ද, අවශ්‍යතාවයන් නොසැපයෙන බැවින් පසුබෑමට ලක් වී ඇත.

මේ හේතූන් නිසා ඉගෙනීමටත්, ක්‍රීඩාවටත්, දක්‍ෂ දරුවෝ වඩා පහසුකම් ඇති පාසල් සොයා යති. ඔවුන් රඳවා ගැනීම පාසලේ ඉදිරි ගමනට රුකුලක් වේ.

රජය මඟින් ලබා දෙන දීමනාව පාසල් ගොඩනැගිලි නඩත්තු කිරීමට සහ අවශ්‍යතාවයන් සැපයීමටවත් ප්‍රමාණවත් නොවේ. නව අන්තර්ජාතික පාසල් සමඟ තරඟ කළ නොහැකි නිසා විදුහල්පතිතුමා සහ ගුරු මණ්ඩලය ද මෙම තත්ත්වය යටතේ අසරණව සිටිති.

විදෙස් රටවල පදිංචිව සිටින අශෝක විදුහලේ ආදි සිසු සිසුවියන්ට ඔවුන් ශිල්ප ලත් පාසල බේරා ගැනීමට දැන් කාලය පැමිණ ඇත.

QUESTION

You are a past pupil of Asoka College. Write a formal letter to the president of the Past Pupils' Association of Australia to persuade the association to take quick action. Suggest some strategies that would help to solve these problems.

ඔබ අශෝක විදුහලේ ආදි සිසුවෙක් හෝ සිසුවියක් වේ. ඕස්ට්‍රේලියාවේ අශෝක විදුහලේ ආදි සිසු සංගමයේ සභාපතිතුමා වෙත, සංගමයට වහා ක්‍රියාත්මක වන ලෙස පොළඹවමින් විධිමත් ලිපියක් ලියන්න. මේ ගැටළු විසඳීම සඳහා උපකාරී විය හැකි ක්‍රම පිළිබඳව ද යෝජනා කරන්න.

*Do not remove this page from the question booklet.*

| Student/Registration Number | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

| Centre Number | | | | | | |
|---|---|---|---|---|---|---|

Sinhala
Continuers Level

Question 9



PLEASE TURN OVER

**End of Section 2**

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

# 2016 Public Examination

# Sinhala
## Continuers Level

### Section 3: Writing in Sinhala (20 marks)

**Instructions to Students**

1. Allow approximately 40 minutes for Section 3.
2. Write your answer to a question from Section 3 in this booklet in black or blue pen. Space is provided for you to make notes.
3. You must answer ONE question in SINHALA.
4. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
5. All question booklets will be collected at the end of the examination.

© Victorian Curriculum and Assessment Authority 2016

**Section 3** (Questions 10–12)
(20 marks)

---

*Your response will be assessed on how well you:*
- *demonstrate depth of treatment of information, ideas and/or opinions*
- *write text appropriate and relevant to context, purpose and audience*
- *structure and sequence information and ideas*
- *manipulate language structures and vocabulary in Sinhala.*

---

Answer ONE question from this section in approximately 250 words in SINHALA.

10. This year, instead of having a birthday party, you donated the money that would have been spent on the party to a children's hospital in Sri Lanka. Write an article for your school magazine, reflecting on your experiences and your joyful feelings after making this decision.

    මේ වසරේ ඔබ විසින් ඔබේ උපන් දිනයට සාදයක් නොපවත්වා, ඒ වෙනුවට සාදයට වැය වන මුදල ශ්‍රී ලංකාවේ ළමා රෝහලකට පරිත්‍යාග කරන ලදි. එම තීරණය ගැනීමෙන් පසු ඔබ ලද අත් දැකීම් සහ ආශ්වාද ජනක හැඟීම් පිළිබිඹු කරමින් ඔබ පාසලේ සඟරාවකට ලිපියක් ලියන්න.

11. 'Social media can be used in much more productive ways than to just follow the social activities of people's friends.' Write an evaluative script for a speech on this topic for a conference about young people and technology.

    'වෙනත් අයගේ මිතුරු මිතුරියන්ගේ සමාජ කටයුතු පිළිබඳ සොයා බලනවා වෙනුවට සමාජ මාධ්‍යය වඩාත් ඵලදායි ලෙස පාවිච්චි කළ හැක.' මේ මාතෘකාව යටතේ යෞවනයන් සහ තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණයක් ඇමතීම සඳහා ඇගයීම් ස්වරූපයේ පිටපතක් ලියන්න.

12. You are very interested in the cultural heritage of Sri Lanka. Write an informative report, to be published in a Sri Lankan weekend newspaper, about ways in which people in Australia maintain Sri Lankan customs and festivals.

    ඔබ ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් පිළිබඳව විශාල උනන්දුවක් දක්වයි. ඕස්ට්‍රේලියාවේ වෙසෙන ජනතාව ශ්‍රී ලංකාවේ සිරිත් සහ උත්සව පවත්වා ගෙන යන අන්දම ගැන විස්තරාත්මක වාර්තාවක් ශ්‍රී ලංකාවේ සති අන්ත පුවත් පතක පළ කිරීම සඳහා ලියන්න.

You may make notes in this space.

Question Number:

**End of Section 3**